# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 17

# දරන මැණික් (කමා කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1973 මැයි මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 17 දරන මැණික් (කමා කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1973 මැයි මස 9 වන දින]

එල්.ඩී.—ඕ. 63/72.

ඒ ඒ තැනැත්තන් විසින් ආදායම් බදු හෝ ව්‍යාපාර පිරිවැටුම් බදු ගෙවීම මගහරින ලද මුදල්වලින් මිලට ගත් මැණික් රජයේ මැණික් සංස්ථාවට හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු ලැබීමට සංචාරකයන්ට විකුණන තැනැත්තන්, නැතහොත් අපනයනය කරන්නන්, තඩු පවරනු ලැබීමට යටත් වීමෙන් හෝ එකී බදු ගෙවීමට බැඳී සිටීමෙන් නිදහස් කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 17 දරන මැණික් (කමා කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක ක්‍රියාත්මක වන්නේ ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

2. තමාගේ නිශ්චිත ආදායමෙන් හෝ පිරිවැටුමෙන් යම් මැණිකක් මිලට ගත් යම් තැනැත්තකු— තඩු පවරනු ලැබීමට සහ ආදායම් බදු සහ ව්‍යාපාර පිරිවැටුම් බදු ගෙවීමට යටත් වීමෙන් ඇතැම් තැනැත්තන් නිදහස් කිරීම.

(අ) අදාළ කාලසීමාව තුළ දී, එම මැණික රජයේ මැණික් සංස්ථාවට විකුණන්නා වූ හෝ මැණික් වෙළෙන්දකු වශයෙන් කටයුතු කිරීමට බලය පවරමින් 1971 අංක 13 දරන රජයේ මැණික් සංස්ථා පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකුව එම මැණික විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු ලැබීමට සංචාරකයකුට විකුණන්නා වූ හෝ අවස්ථාවක දී, නැතහොත්

(ආ) අදාළ කාලසීමාව තුළ දී, එම මැණික රජයේ මැණික් සංස්ථාවේ මාර්ගයෙන් හෝ 1971 අංක 13 දරන රජයේ මැණික් සංස්ථා පනතේ 16 වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයක බලය යටතේ හා එම නියමයේ නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව හෝ අපනයනය කරන්නා වූ අවස්ථාවක දී,

ඒ තැනැත්තා විසින් ඒ මැණික මිලට ගැනීමට ගෙවන ලද මුදල වශයෙන් දේශීය ආදායම් කොමසාරිස්වරයා සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලබන මුදලේ සහ එම විකිණීමෙහි ලා හෝ අපනයනය කිරීමෙහි ලා දරන ලද යම් වියදමක් වෙනුවෙන් සාධාරණය යි දේශීය ආදායම් කොමසාරිස්වරයා සලකන මුදල් ප්‍රමාණයකත් එකතුවට සමාන වන, නිශ්චිත ආදායමේ හා පිරිවැටුමේ යම් මුදලක් වෙනුවෙන්—

(i) ආදායම් බදු හෝ ව්‍යාපාර පිරිවැටුම් බදු ගෙවීමට ඒ තැනැත්තාගේ බැඳීමක් නොවිය යුතු ය ; නැතහොත්

(ii) ආදායම් බද්දට හෝ ව්‍යාපාර පිරිවැටුම් බද්දට අදාළ නීති යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් තඩු පවරනු ලැබීමට ඒ තැනැත්තා යටත් නොවිය යුතු ය :

2—එක් 21028—9,332 (73/3)

එසේ වුව ද, ආදායම් බද්දට හෝ ව්‍යාපාර පිරිවැටුම් බද්දට අදාළ නීතියෙහි විධිවිධාන පිළිබඳව කරන ලදැයි කියනු ලබන හෝ සැක කොට ඇති යම් කඩකිරීමක් පිළිබඳ වූ විමර්ශන මේ පනත පනවනු ලබන දිනයට පෙර ආරම්භ වී ඇතහොත්, ආදායම් බදු හෝ ව්‍යාපාර පිරිවැටුම් බදු ගෙවීමේ ඒ තැනැත්තාගේ බැඳීම කෙරෙහි හෝ එම නීතිය යටතේ නඩු පවරනු ලැබීමට ඒ තැනැත්තාගේ යටත්වීම කෙරෙහි, නැතහොත් එකී යම් නීතියක් පිළිබඳව කරන ලදැයි කියනු ලබන යම් කඩ කිරීමක් සම්බන්ධයෙන් මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි යම් අධිකරණයක් ඉදිරියෙහි පවත්නා ඒ තැනැත්තාට විරුද්ධ යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවත්වා ගෙන යෑම කෙරෙහි මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධානවල කිසිවක් බල නොපෑ යුතු ය.

අර්ථ නිරූපණය.

3. මේ පනතෙහි—

"අදාළ කාලසීමාව" යන්නෙන්, මේ පනත ක්‍රියාත්මක වන දින යෙන් ආරම්භ වන මාස තුනක කාලසීමාව අදහස් වේ;

"නිශ්චිත ආදායම හෝ පිරිවැටුම" යන්නෙන්, තමා විසින් ආදායම් හෝ පිරිවැටුම් වාර්තාවක් ඉදිරිපත් කර නොමැති හෝ එවැනි යම් වාර්තාවක හෙළි කිරීම පැහැර හැර ඇති ආදායමක් හෝ පිරිවැටුමක් වූ යම් තැනැත්තකුගේ ආදායම හෝ යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක පිරිවැටුම අදහස් වේ;

"මැණික්" යන්නට 1971 අංක 13 දරන රජයේ මැණික් සංස්ථා පනතේ එයට දී ඇති අර්ථයම ඇත;

"රජයේ මැණික් සංස්ථාව" යන්නෙන් 1971 අංක 13 දරන රජයේ මැණික් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද රජයේ මැණික් සංස්ථාව අදහස් වේ;

"විදේශීය ව්‍යවහාර මුදල්" යන්නට විනිමය පාලන පනතේ එයට දී ඇති අර්ථයම ඇත;

"සංචාරකයා" යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවූ ද ආගාමික හා විගාමික පනත යටතේ බලය ලත් නිලධරයකු විසින් තමාට දෙන ලද ඊට සහතක් දරන වලංගු ගමන් බල පත්‍රයක් දරන්නා වූ ද යම් තැනැත්තෙක් අදහස් වේ.